**17-02-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් කිසිම දුකක් හෝ පාපයක් නොමැති අමරණීය දේශය, ස්ථාපිත කිරීමේ උපකරණයි. එය පාපයෙන් තොර ලෝකයයි.

**ප්‍රශ්නය:** දේවමය පවුලේ ආශ්චර්යමත් සැලසුම කුමක්ද?

**පිළිතුර:** දේවමය පවුලේ සැලසුම වන්නේ පවුල් සංවිධානය ඇති කර, අනේක ආගම් විනාශ කර, සත්‍යයේ එක් ධර්මය ස්ථාපිත කිරීමයි. මිනිසුන් පවුල් සංවිධානය කිරීමට සැලසුම් සාදයි. පරමාත්ම පියා පවසන්නේ : ඔවුන්ගේ සැලසුම් ක්‍රියාත්මක විය නොහැක. නව ලෝකය ස්ථාපිත කිරීමට පැමිණෙන්නේ මා පමණයි එවිට අන් සියලුම ජීවාත්ම ආපසු උඩ ඉහළ නිවහනට යයි. ඉතාමත් සුළු ජීවාත්ම ප්‍රමාණයක් ඉතිරි වෙයි.

ඕම් ශාන්ති. මෙය නිවසක්, විශ්ව විද්‍යාලයක් මෙන්ම ආයතනයකි. ඔහු ශිව බාබා බවත්, ජීවාත්මයක් යනු, සිරුර අයිති, සැලිග්‍රමයක් බවත් ඔය දරුවන්ට, ජීවාත්මයන්ට වැටහෙයි. සිරුර, 'මගේ ජීවාත්මය' යැයි නොකියයි. ජීවාත්මය පවසන්නේ 'මගේ ශරීරය' කියාය. ජීවාත්මය අවිනාශී වන අතර සිරුර, විනාශ වෙයි. ඔබ දැන් තමන් ජීවාත්ම බව සලකයි. ශිවා, අපගේ බාබා වන අතර ඔහු උත්තරීතර පියාය. ඔහු ඔබගේ උත්තරීතර බාබා බව, ඔය ජීවාත්ම දන්නවා. තවද ඔහු උත්තරීතර ගුරුවරයා මෙන්ම උත්තරීතර ගුරුද වෙයි. භක්ති මාර්ගයේ මිනිසුන් හඬන්නේ අහෝ, දෙවි පියාණෙනි! මරණ මංචකයේ පවා ඔවුන් පවසන්නේ අහෝ දෙවියනේ! අහෝ ඊෂ්වර! ඔවුන් කන්නලව් කරන නමුත්, සියලුම ජීවාත්මයන්ගේ පියා එක්කෙනෙක් බව, කිසිම කෙනෙකුගේ බුද්ධියේ සනිටුහන් වන්නේ නැත. පැවසෙන්නේ 'අහෝ, පාරිශුද්ධකරු' කියාය. එබැවින් ඔහු ගුරුද වන්නේය. ඔවුන් කියන්නේ අපව දුකින් මුදවා, සාම දේශයට රැගෙන යන්න. එබැවින් ඔහු පියා මෙන්ම පාරිශුද්ධකරු වන සත්ගුරුය. තවද ඔහු අපිට ලෝක චක්‍රය භ්‍රමණය වන ආකාරය, මනුෂ්‍යයන් උපත් 84 ක් ගන්නා ආකාරය මෙන්ම ලෝකයේ අසීමිත භූගෝලය සහ ඉතිහාසය විස්තර කර දෙන බැවින්, ඔහු උත්තරීතර ගුරුවරයාද වෙයි. අවිද්‍යා මාවතේ පියවරු, ගුරුවරු සහ ගුරුන් යන සියල්ල වෙන් වෙන් වූ අයයි. මෙහිදී අසීමිත පියා, ගුරුවරයා සහ ගුරු යන සියල්ල එක්කෙනෙකි. එය විශාල වෙනසකි! අසීමිත පියා ඔය දරුවන්ට අසීමිත උරුමය ලබා දෙයි. එම පියවරුන් දෙන්නේ සීමිත උරුමයන්ය. එම ඉගෙනුම්ද සීමිතයි. කිසිම කෙනෙක් ලෝක ඉතිහාසය සහ භූගෝලය නොදනී. ලක්ෂ්මි සහ නාරායන ඔවුන්ගේ රාජධානිය ලබාගත් අන්දම හෝ ඔවුන්ගේ රාජධානිය කෙතරම් කාලයක් පැවතුණාද හෝ රිදී යුගයේ රාමා සහ සීතා කෙතරම් කාලයක් පාලනය කළේද කියා කිසිම කෙනෙක් නොදනී. ඔවුන් කිසිම දෙයක් දන්නේ නැත. අසීමිත පියා ඔබට ඉගැන්වීමට පැමිණ ඇති බව ඔය දරුවන්ට දැන් වැටහෙයි. බාබා ඔබට විමුක්තියට මාර්ගයද පෙන්වයි. ඔබ උපත් 84 ක් ගැනීමෙන් අපවිත්‍ර විය. ඔබ දැන් පිවිතුරු විය යුතුයි. මෙය තමෝප්‍රධාන් ලෝකයයි. සෑම දෙයක්ම සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්ව හරහා යයි. මෙම ලෝකයේ වයස වුවද අළුත් බවින් පැරණි වී ඉන්පසුව පැරණි බවින් අළුත් වෙයි. ස්වර්ණමය යුගයේ තිබුණේ භාරතය පමණක් බවත්, දේවතාවන් එහි පාලනය කළ බවත් සෑම කෙනෙක්ම දන්නවා. එය දෙවිවරුන් සහ දෙවඟනන්ගේ රාජධානිය විය. අච්චා, ඉන්පසුව සිදු වූයේ කුමක්ද? ඔවුන් පුනර්භව ගත්තා. සතෝප්‍රධාන් බවින් ඔවුන් සතෝ, රජෝ සහ තමෝ විය ඔවුන් උපත් අහවල් ප්‍රමාණයක් ගත්තා. වසර 5000 කට පෙර, එය භාරතයේ ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය වූ සමයේ, මනුෂ්‍යයෙකුගේ සාමාන්‍ය ආයුෂ වසර 125 සිට 150 විය. එය අමරණීය දේශය ලෙස හැඳින්විය එහි කිසිදා අකල් මරණ නැත. මෙය මරණීය දේශයයි. අමරණීය දේශයේ මිනිසුන් අමරණීයව සිටියි ඔවුන්ට දීර්ඝ ආයුෂ කාලයක් ඇත. ස්වර්ණමය යුගයේ තිබෙන්නේ පිවිතුරු ගෘහස්ථ ආශ්‍රමයයි. එයට පාපයෙන් තොර ලෝකය යැයි කියයි. එය දැන් දූෂිත ලෝකයයි. ඔබ ශිව බාබාගේ දරුවන් බව ඔය දරුවන් දැන් දන්නවා. ඔබට ශිව බාබාගෙන් උරුමයක් ලැබෙයි. මෙම කෙනා දාදා (ජ්‍යෙෂ්ඨ සහෝදරයා) වන අතර එම කෙනා සීයාය. ඔබට උරුමය හිමි වන්නේ සීයාගෙනි. සීයාගේ දේපළ වලට සෑම කෙනෙකුටම අයිතියක් තිබේ. බ්‍රහ්මට ප්‍රජාවගේ පියා (ප්‍රජාපිතා) යැයි කියයි. ආදම් සහ ඒව ආදම් සහ ඔහුගේ භාර්යාව. එම කෙනා අශාරීරික දෙවි පියාණන්ය. මෙම කෙනා (ප්‍රජාපිතා) ශාරීරික පියාය. ඔහුට ඔහුගේම සිරුරක් තිබෙන අතර ශිව බාබාට ඔහුගේම කියා ශරීරයක් නැත. ඔබට ඔබගේ උරුමය බ්‍රහ්මගේ මාර්ගයෙන් ශිව බාබාගෙන් ලැබෙයි. ඔබට සීයාගේ දේපළ ලැබෙන්නේ පියාගේ මාර්ගයෙනි. ශිව බාබා විසින් ඔබව නැවත වතාවක් මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට, බ්‍රහ්ම බාබාගේ මාර්ගයෙන් පත් කරවයි. ඔවුන් ග්‍රාන්ත්හි

(සීක් ආගමේ ග්‍රන්ථය) ඔහුගේ වර්ණනාව ගායනා කරන්නේ මෙසේය, 'මනුෂ්‍යයන්ව දේවතාවන් බවට පරිවර්ථනය කිරීමට, දෙවියන්ට වැඩි කාලයක් ගත වූයේ නැත.' ඔබව එය බවට පත් කළේ කවුරුන්ද? පරමාත්ම දෙවියන්! ග්‍රාන්ත්හී බොහෝ වර්ණනා තිබේ. බාබා පවසන්නේ ඇල්ෆා සිහි කරන්න, එවිට බීටා, රාජධානිය, ඔබගේ වෙයි. ගුරු නානක් පවා පැවසුවේ ස්වාමියාගේ නාමය ජප කරන්න, එවිට ඔබට සතුට ලැබෙයි. ඔවුන් පියාගේ එම අශාරීරික අමරණීය ස්වරූපයේ ප්‍රශංසාව ගායනා කරයි. පරම පියා පවසන්නේ මා සිහිපත් කරන්න, එවිට ඔබට සතුට ලැබෙයි. දැන්, සෑම කෙනෙක්ම පියාව සිහි කරයි. යුද්ධය අවසන් වන විට, ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානියේ එක් ධර්මය පමණක් තිබෙයි. මෙම කාරණා වටහා ගත යුතුයි. පරමාත්ම දෙවියන් පවසයි පාරිශුද්ධකරු සහ ඥානයේ මහා සයුර ලෙස හැඳින්වෙන්නේ පරමාත්ම දෙවියන් පමණයි. දුක නැති කර, සතුට පිරිනමන්නා වන්නේ ඔහුම පමණයි. අපි පරමාත්ම පියාගේ දරුවන් බැවින්, අපිට අනිවාර්යෙන්ම සතුට තිබිය යුතුයි. භාරතයේ ජනතාව සැබවින්ම ස්වර්ණමය යුගයේ පැවතුණා. ඉතිරි සියලුම ජීවාත්ම සිටියේ සාම දේශයේය. දැන් සියලුම ජීවාත්ම මෙහි පහළට පැමිණෙනවා. එවිට අපි ගොස් ස්වර්ණමය යුගයේ අපගේ දේවතා චරිත කොටස් රඟ දක්වනවා. මෙම පැරණි ලෝකය, දුක් දේශය වන අතර නව ලෝකය, සතුටේ දේශයයි. නිවසක් පැරණි වන විට, මීයන් සහ සර්පයන් මතුවනවා. මෙම ලෝකයද එවැනිය. මෙම චක්‍රයේ කාල වකවානුව වසර 5000 කි. මෙය දැන් අවසානයයි. නව ලෝකයක්, නව දිල්ලියක්, දෙවියන්ගේ (රාමා) රාජධානියක් ගාන්ධිජීටද අවශ්‍ය විය. කෙසේවෙතත්, මෙය පරමාත්ම පියාගේම කාර්යය පමණයි. රාමාගේ රාජධානිය යැයි කියන්නේ දේවතාවන්ගේ රාජධානියට පමණයි. නව ලෝකයේ ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානිය අනිවාර්යෙන්ම තිබෙයි. පළමුව රාධේ සහ ක්‍රිෂ්ණා වෙනස් රාජධානි දෙකකට අයත් වන අතර, ඔවුන්ගේ විවාහයෙන් අනතුරුව ඔවුන් ලක්ෂ්මී සහ නාරායන බවට පත් වෙයි. ඔවුන් නිසැකයෙන්ම මෙම උපතේදී එවන් ක්‍රියා සිදු කරන්නට ඇති. පරම පියා මෙතැන අසුන් ගෙන ඔබට කර්ම, අකර්ම සහ විකර්ම න්‍යාය කියා දෙයි. රාවණාගේ රාජධානියේ මිනිසුන් කුමන ක්‍රියා සිදුකළත් ඒවා පාපකාරීය. ස්වර්ණමය යුගයේ ක්‍රියාවන් අකර්මයි (උදාසීනයි). මෙයත් ගීතාවේ සඳහන් වී ඇති නමුත් ඔවුන් නම වෙනස් කර ඇත. එය වැරදීමකි. ක්‍රිෂ්ණාගේ උපන් දිනය සිදු වන්නේ ස්වර්ණමය යුගයේය. ශිවා අශාරීරික උත්තරීතර පියාය. ක්‍රිෂ්ණා ශාරීරික මනුෂ්‍යයෙකි. පළමුව තිබෙන්නේ ශිවාගේ උපන් දිනයයි. ඉන්පසුව ඔවුන් භාරතයේ, ක්‍රිෂ්ණාගේ උපන් දිනය සමරයි. ඔවුන් ශිව රාත්‍රිය ගැන කතා කරයි. පරමාත්ම පියා පැමිණ භාරතයට දිව්‍ය ලෝකයේ රාජධානිය ලබා දෙයි. ශිවාගේ උපන් දිනයට පසුව, ක්‍රිෂ්ණාගේ උපන් දිනය තිබේ. මේ දෙක අතර, පාරිශුද්ධත්වය අවශ්‍ය බැවින්, රාඛි තිබේ. පැරණි ලෝකයේ විනාශයද සිදුවිය යුතුයි. එබැවින් යුද්ධය සිදු වී, සෑම දෙයක්ම විනාශ වී, ඉන්පසුව ඔබ පැමිණ, නව ලෝකයේ පාලනය කරයි. ඔබ ඉගෙනගන්නේ මෙම පැරණි ලෝකය, මරණීය දේශය වෙනුවෙන් නොවෙයි. ඔබගේ ඉගෙනුම, නව ලෝකය, අමරණීය දේශය වෙනුවෙනි. එවන් වෙනත් කොලීජියක් නැත. පරම පියා පවසන්නේ එය දැන් මරණීය දේශයේ අවසානයයි, එබැවින් ඔබ ඉගෙනගෙන විගසින් දක්ෂ විය යුතුයි. ඔහු, පියා මෙන්ම පාරිශුද්ධකරුයි, තවද ඔහු ඔබට උගන්වයි. මෙය දෙව් පියාණන්ගේ විශ්ව විද්‍යාලයයි. පරමාත්ම දෙවියන් කතා කරයි! ක්‍රිෂ්ණා, ස්වර්ණමය යුගයේ රජ කුමරාය. ඔහුටද උරුමයක් ලැබෙන්නේ ශිව බාබාගෙන්ය. මෙකල, ඔබ සෑම කෙනෙක්ම අනාගතය වෙනුවෙන් ඔබගේ උරුමය හිමි කරගන්නවා. ඔබ ඉගෙනගන්නා ප්‍රමාණයට අනුව ඔබට උරුමයක් හිමි වෙයි. ඔබ ඉගෙනගන්නේ නැත්නම් ඔබගේ තත්ත්වය පහත් වෙයි. ඔබ කොහේ ජීවත් වුවත් කම් නැත, ඔබ අඛණ්ඩව ඉගෙන ගත යුතුයි. විදේශයන්ටද මුරලි යවනු ලබයි. බාබා දිගින් දිගටම ඔබට දිනපතාම අනතුරු අඟවයි. දරුවනි, පියාව සිහි කරන්න, මන්ද මෙය කිරීමෙන් ඔබගේ පාපයන් දුරුවී යයි. ජීවාත්මයේ ඇති මිශ්‍ර ලෝහ ඉවත් වෙයි. ජීවාත්මය 100% පිවිතුරු විය යුතුයි. එය දැන් අපවිත්‍රයි. මිනිසුන් බොහෝ භක්තියේ යෙදෙයි. මිනිසුන් සිය දහස් ගණනින් වන්දනා ගමන් සහ ආගමික රැස්වීම් වලට යයි. එය උපතින් උපතට පැවතී ඇත. ඔවුන් බොහෝ දේවාල ආදිය තනා, බොහෝ උත්සාහ දරයි. ඒ තිබියදී ඔවුන් ඉනිමඟ දිගේ අඛණ්ඩව පහළට පැමිණ ඇත. ඔබගේ ඉහළ නැඟීමේ තත්ත්වය තුළින් ඔබ සතුටේ දේශයට යන බවත් ඉන්පසුව ඔබට පහළට පැමිණෙන්ට සිදුවන බවත් ඔබට දැන් වැටහෙයි. ඉන්පසුව අංශක දිගින් දිගටම අඩුවෙයි. අළුත් නිවසක අලංකාරය, වසර 10 කට පසුව නිසැකයෙන්ම අඩුවෙයි. ඔබ ස්වර්ණමය යුග, නව ලෝකයේ සිටියා. ඉන්පසුව වසර 1250 කට පසුව, රාමාගේ රාජධානිය ආරම්භ විය. ලෝකය දැන් සම්පූර්ණයෙන්ම තමෝප්‍රධාන්‍ය. මනුෂ්‍යයන් විශාල ප්‍රමාණයක් සිටියි! ලෝකය පැරණි වී ඇත. ඒ මිනිසුන් පවුල් සංවිධානය සඳහා අඛණ්ඩව සැලසුම් සාදයි. ඔවුන් දිගින් දිගටම බොහෝ සේ අවුලට පත්වෙයි. මෙය පරමාත්ම දෙවියන්ගේ, පියාගේ කාර්යය පමණක් බව, අපි ලියන්නෙමු. මිනිසුන් ලක්ෂ 9 යේ සිට මිලියනයක්, ස්වර්ණමය යුගයට ගොස් වාසය කරයි. ඉතිරි සියලු දෙනා ගොස් ඔවුන්ගේ

මිහිරි නිවහනේ සිටියි. මෙය දේවමය පවුල් සංවිධානයයි එක් ධර්මයක් ගොඩනැඟීම සහ අන් සියලු ආගම් වල විනාශය. පරමාත්ම පියා ඔහුගේ කාර්යය සිදු කරනවා. ඒ මිනිසුන් පවසන්නේ ඔබට පාපයේ ගැලෙන්නට අවසර තිබේ, නමුත් තව දරුවන් බිහි නොකරන්න! ඒ අන්දමින් කිසි දෙයක් ඉටු වන්නේ නැත. මෙම සැලසුම් කිරීම තිබෙන්නේ අසීමිත පියාගේ අතේ පමණයි. පරමාත්ම පියා පවසන්නේ දුක් දේශය, සතුටු දේශය බවට පත් කරවීමට පැමිණෙන්නේ මා පමණයි. සෑම වසර 5000 කදීම, කලි යුගයේ අවසානය සහ ස්වර්ණමය යුගයේ ආරම්භය අතරමැදදි මා පැමිණෙනවා. මෙය දැන් අපවිත්‍ර ලෝකය, පිවිතුරු ලෝකය බවට පත් වන, සංගම යුගයයි. නව ලෝකය ස්ථාපිත කර පැරණි ලෝකය විනාශ කිරීම පරමාත්ම පියාගේ කාර්යය පමණයි. ස්වර්ණමය යුගයේ තිබුණේ එක් ධර්මය පමණයි. ලක්ෂ්මී සහ නාරායන ලෝකයේ අධිපතියන් විය, අධිරාජයා සහ අධිරාජිනිය. රෝසරිය නිර්මාණය වී තිබෙන්නේ කාගේ සිහිවටනයක් ලෙසින්ද කියාත් ඔබ දන්නවා. ඉහළින්ම මල (ටසලය), ශිව බාබා, ඇති අතර ඉන්පසුව ද්විත්ව පබුළු, බ්‍රහ්ම සහ සරස්වති ඇත. මෙය ඔවුන්ගේ රෝසරියයි එය ලෝකය, අපායේ සිට දිව්‍ය ලෝකකය බවට, අපවිත්‍ර බවින් පාරිශුද්ධ බවට පරිවර්ථනය කරන අයගේය. යහපත් කාර්ය සිදුකර, පිටත්ව ගිය අය සිහිපත් කෙරෙයි. පරම පියා විස්තර කරයි ස්වර්ණමය යුගයේ ඔවුන් පිවිතුරු විය එය පිවිතුරු පවුල් මාවත විය. ඔවුන් දැන් අපවිත්‍රයි. මෙසේ ගැයෙයි ඕ පාරිශුද්ධකරු, වඩිනු මැන! පැමිණ අපව පිවිතුරු කරන්න! ස්වර්ණමය යුගයේ ඔබ මේ අන්දමින් අඬ ගසන්නේ නැත. ඔවුන් සතුටින් සිටින විට, කිසි කෙනෙක් පරම පියා සිහි කරන්නේ නැත. දුක් ඇති කලට, සෑම කෙනෙක්ම ඔහුව සිහි කරයි. පරම පියා විමුක්තිය ලබා දෙන්නා, දයාවෙන් සපිරි මෙන්ම ආනන්දයෙන් පිරි කෙනාය. ඔහු පැමිණ, සෑම කෙනෙකුටම විමුක්තිය සහ ජීවන-මුක්තිය ලබා දෙයි. මිනිසුන් ඔහුට කන්නලව් කරන්නේ පැමිණ අපව අපගේ මිහිරි නිවහනට ගෙන යන්න. දැන් සතුටක් නැත. එය දැන් මිනිසුන් විසින් ඇති කළ මිනිසුන්ගේ රජයයි. ස්වර්ණමය යුගයේ රජ, රැජිණ සහ පුරවැසියන් සිටියි. ඔබ ලෝකයේ අධිපතියන් වන්නේ කෙසේද කියා පරම පියා ඔබට පවසයි. එහිදී ඔබට බොහෝ ධනය, අනන්ත ධනය තිබෙයි. එහි ගොඩනැගිලි සෑදී තිබෙන්නේ රත්තරං ගඩොල් වලින්ය. රන් ගඩොල්, යන්ත්‍ර වලින් මතු වෙයි. ඉන්පසුව ඔවුන් එම ගඩොල් මත, දියමන්ති සහ මැණික් සවි කරයි. තඹ යුගයේදි පවා බොහෝ දියමන්ති තිබුණි! ඉන්පසුව ඒවා කොල්ල කන ලදී. දැන් රත්තරං කොහෙවත් දකින්නට නැත. මෙයද නාටකයේ නියම වී තිබේ. පරමාත්ම පියා පවසන්නේ මා සෑම වසර 5000 කට වරක් පැමිණෙනවා. පැරණි ලෝකයේ විනාශය සඳහා පරමාණුක බෝම්බ ආදිය නිර්මාණය කර තිබේ. එය විද්‍යාවයි. තමන්ගේම වංශය විනාශ කර දමන එවන් දේ නිර්මාණය කිරීමට, ඔවුන් තම බුද්ධිය භාවිත කරයි. ඔවුන් ඒවා නිපදවන්නේ නිකම්ම ගබඩා කර තැබීමට නොවෙයි පෙර හුරුවීම් අඛණ්ඩව සිදු වෙයි. රාජධානිය ස්ථාපිත වන තුරු, යුද්ධය ආරම්භ විය නොහැක. සූදානම් කිරීම්, පිළියෙල වෙමින් පවතිනවා ස්වභාවික ව්‍යසනද මේ සියල්ලට ඇතුලත්ය. එතරම් මිනිසුන් සිටින්නේ නැත. ඔය දරුවන් දැන් මෙම පැරණි ලෝකය අමතක කළ යුතුයි. ඔබගේ මිහිරි නිවහන සහ දිව්‍ය ලෝකකයේ ආධිපත්‍යය පමණක් සිහි කරන්න. අළුත් නිවසක් තනන විට, බුද්ධිය සිහිකරන්නේ නව නිවස පමණයි. නව ලෝකය දැන් ස්ථාපිත වනවා. පරමාත්ම පියා, සියල්ලන්ටම විමුක්ති දායකයාය. සියලුම ජීවාත්ම ආපසු නිවසට යන අතර ඔවුන්ගේ සිරුරු මෙහි විනාශ වෙයි. පරමාත්ම පියා සිහිපත් කිරීමෙන් ජීවාත්ම පිවිතුරු වෙයි. ඔබ අනිවාර්යෙන්ම පිවිතුරු විය යුතුයි! දේවතාවන් පිවිතුරුයි. දේවතාවන් ඉදිරියේ සිගරට්, දුම්කොළ ආදිය කිසිදා නොතබයි ඔවුන් වයිශ්නවයන්ය. එයට විෂ්ණුගේ දේශය යැයි කියයි. මෙය දූෂිත ලෝකය වන අතර එය දූෂණයෙන් තොර ලෝකයයි. ඔබ දැන් දූෂණයෙන් තොර ලෝකයට යා යුතුයි. ඉතිරිව තිබෙන්නේ ඉතාමත්ම කෙටි කාලයකි. පරමාණුක බෝම්බ වලින් සියල්ල විනාශ වෙයි කියා ඔබටම වටහාගත හැක. යුද්ධය අනිවාර්යෙන්ම සිදුවෙයි. ඔවුන් පවසන්නේ කවර හෝ කෙනෙක් ඔවුන්ට ඒ සියලු දේ නිපදවීමට දිරිමත් කරවන බවත්, ඔවුන් ඒවා අඛණ්ඩව නිපදවන්නේ එබැවින් කියාය. ඒවා මඟින් ඔවුන්ගේම වංශයේ අය විනාශ වන බව ඔවුන් දන්නා නමුත්, ඔවුන්ට ඒවා නිපදවීම නතර කළ නොහැක. ශංකර් මඟින් විනාශය සිදුවීමද නාටකයේ නියම වී තිබේ. විනාශය අත ලඟය. ඥානයේ යාගහෝමය තුළින් විනාශයේ ගිණි දැල් මතු වෙයි. ඔබ දැන් ඉගෙනගනිමින් සිටින්නේ ලෝකයේ අධිපතියන් වීමටයි. මෙම පැරණි ලෝකය විනාශ වී, නැවත අළුත් වීමටයි යන්නේ. මෙම චක්‍රය අඛණ්ඩව බ්‍රමණය වෙයි. ඉතිහාසය නැවත නැවතත් සිදු විය යුතුයි. පළමුවෙන්ම ආදි සනාතන දෙවි දේවතා ධර්මය තිබෙන අතර ඉන්පසුව චන්ද්‍ර වංශික ක්ෂත්‍රීය ආගම තිබෙයි. ඉන්පසුව මුස්ලිම්වරුන්, බෞද්ධයින් ආදිය පැමිණෙන අතර, පසුව අංක එක (ශිව බාබා) අනිවාර්යෙන්ම නැවතත් පැමිණ, අන් සියල්ලම විනාශ වෙයි. ඔය දරුවන්ට උගන්වනනේ කවරෙක්ද? අශාරීරික ශිව බාබාය ඔහු ගුරුවරයා මෙන්ම සත්ගුරුය. ඔහු පැමිණි විගසම ඔබට ඉගැන්වීම ආරම්භ කරයි, මේ නිසයි මෙසේ ලියා තිබෙන්නේ ශිවාගේ උපන් දිනය, ගීතාවේද උපන් දිනයයි. ගීතාවේ

උපන් දිනය, ශ්‍රී ක්‍රිෂ්ණාගේද උපන් දිනයයි. ශිව බාබා ස්වර්ණමය යුගය ස්ථාපනය කරනවා. ක්‍රිෂ්ණාගේ දේශයට ස්වර්ණමය යුගය යැයි කියයි. ඔබට උගන්වන්නේ පූජකයෙක්, සාන්තුවරයෙක් හෝ මනුෂ්‍යයෙක් නොවෙයි. ඔබට උගන්වන්නේ සතුට පිරිනමන්නා සහ දුක නැතිකරන්නා වන අසීමිත පියාය. ඔහු ඔබට උපත් 21 කට උරුමයක් ලබා දෙයි. විනාශය සිදු විය යුතුයි. මෙසේ කියන්නේ මෙකල පිළිබඳවයි සමහරුන්ගේ ධනය පොළව යට වැලලී තිබුණි, සමහරුන්ගේ ධනය රජය කොල්ල කැහ... බොහෝ සොරකම් ආදිය සිදුවෙයි. ගිණි ගැනීම්ද සිදුවෙයි. සෑම දෙයක්ම මෙම යාග ගින්නට බිලි වෙයි. දැන් යම් තැනක කුඩා ගින්නක් හටගත් විට, එය විගසින් නිවා දමයි. එයට ටික කාලයක් ගත වෙයි. සෑම කෙනෙක්ම එකිනෙකා සමඟ සටන් කරගනී. ඔවුන්ගේ සටන් නතර කිරීමට කිසිවෙකු ඉතිරි නොවෙයි. ලේ ගංඟාවන් වලට පසුව කෂීර ගංඟා ගලයි. එයට හේතුවක් නොමැති ලේ ගැලීම් යැයි කියයි. දරුවන් දර්ශන දැක ඇති නමුත් ඔබ ඒ සියල්ල ඔබගේ භෞතික ඇස් දෙකින්ද ඒ කාලයට දකීවි. විනාශයට පෙර පරමාත්ම පියා සිහිපත් කරන්න, එවිට ඔය ජීවාත්ම තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් බවට පත් වෙයි. පරම පියා ඔබව නව ලෝකයේ ස්ථාපනයට සූදානම් කරමින් සිටිනවා. රාජධානිය සම්පූර්ණයෙන්ම ස්ථාපිත කළ පසු, විනාශය සිදුවෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. විෂ්ණුගේ දේශයට යාමට, තමන්ව සුදුස්සෙක් කරගන්න. සම්පූර්ණයෙන්ම පිවිතුරු වන්න. අපවිත්‍ර ආහාර පාන අත්හරින්න. විනාශය සිදු වීමට පෙර, ඔබට ඇති සෑම දෙයක්ම වටිනා අන්දමකින් භාවිත කරන්න.
2. ඉගෙනගෙන, විගසින් දක්ෂ වන්න. කිසිම පාපකර්මයක් සිදු නොකිරීමට අවධානය යොමු කරන්න.

**වරදානය:** ඔබ පැමිණිලි (ෆරියාද්) ස්මරණය (යාද්) බවට පරිවර්තනය කර ස්වාභාවික හා නිරන්තර යෝගීවරයෙකු වේවා.
සංගම් යුගයේ විශේෂත්වය නම්, ඔබ දැන් උත්සාහ කර එහි ඵලය ක්ෂණිකව ලබා ගැනීමයි. මිනිත්තුවකට ස්මරණයෙ ප්‍රතිමූර්තියක් වූ විට, ඔබ ඒ සැනින්ම ලැබීම් අත්විඳියි. අනාගතය සහතිකයි, නමුත් අනාගතයට වඩා උසස් වන්නේ ඔබේ උසස් වර්තමාන වාසනාවයි. ඔබේ වාසනාවේ කුල්මත් බව පවත්වා ගන්න, එවිට ඔබට ස්වභාවික ස්මරණයේ සිටීමට හැකි වනු ඇත. ස්මරණය ඇති තැන, පැමිණිලි තිබිය නොහැක. "මට කුමක් කළ හැකිද? මට මෙය කළ හැක්කේ කෙසේද? මට මෙය කළ නොහැක, මට උදව්වක් දෙන්න". මේවා පැමිණිලියි. එබැවින්, පැමිණිලි කිරීම නවතා ස්වභාවික හා නිරන්තර යෝගීවරයෙකු වන්න.

**පාඨය:** තමන් අමුත්තන් ලෙස සලකමින් ඉදිරියට යන අය ශ්‍රේෂ්ඨත්වයේ අවධිය අත්විඳිති.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න.**

ඔබ සමූහයේ බලය, සෙනෙහසේ බලය, එකිනෙකාගේ සහයෝගීතාවයේ බලය සහ ඉවසීමේ බලය රැස් කරගත් පසු, මායාට ඔබට පහර දීමට නොහැකි වනු ඇත, එවිට ජයග්‍රහණයේ බෙර වාදනය වනු ඇත. ඔබ සියල්ලන්ම එක්සත් වී සිටින බව පෙනෙන විට, ඔබ ඒකායන තැනැත්තාගේ සෙනෙහසේ, නිරන්තර සහ ස්ථාවර අවධියක රැඳී සිටින විට, හෙළිදරව් කිරීමේ සලකුණු දෘශ්‍යමාන වනු ඇත. ඔබ සැමගේ පොරොන්දුව මෙම හෙළිදරව්ව ගෙන එනු ඇත.